# ඇලෙයිනා බී. ටෙප්ලිට්ස් තානාපතිතුමිය
# පාත්ෆයින්ඩර් ආයතනයෙහි ඉන්දියානු සාගර ආරක්ෂා සමුළුවේදී පලකළ අදහස්

**2020 නොවැම්බර් 10**

බොහොම ස්තුතියි, සුභ දහවලක් වේවා. ගෞරවණීය අමුත්තනි, කීර්තිමත් මණ්ඩල සාමාජිකයිනි, සහභාගිවන සියළුදෙනා සහ විදේශ ලේකම්තුමනි, විශේෂයෙන්ම පොම්පෙඕ රාජ්‍ය ලේකම්තුමාගේ සාර්ථක ඉන්දියා, ශ්‍රී ලංකාව සහ මාලදිවයින් සංචාරයෙන් පසුව සහ මාලදිවයින්හි තානාපති කාර්යාලයක් පිහිටුවීමට එක්සත් ජනපදයේ අදහස නිවේදනය කිරීමෙන් පසුව මේ අවස්ථාවේදී, ඉන්දියානු සාගර කලාපයේ ආකෂාව සම්බන්ධයෙන් ඇති සංකීර්ණතා සාකච්ඡාවට ගැනෙන මෙම සමුළුවේ සමාරම්භක අවස්ථාවට ඔබ සියළුදෙනා සමගින් එක්වන්නට හැකිවීම පිළිබඳ මා ඉතාමත් සතුටු වනවා.

මේ වැදගත් සංවාදය සඳහා අප මෙම ස්ථානයට ඒකරාශී කළ පාත්ෆයින්ඩර් පදනමට සහ සමුළුවේ සම-සභාපතිත්වය දරන ගුණතිලක තානාපතිතුමා හා මෙනන් තානාපතිතුමා විශේෂයෙන් පිළිගැනීමට ලක් කිරීමට මා කැමතියි, එමෙන්ම, නිදහස් හා විවෘත ඉන්දියානු සාගරයක් යන සංකල්පය සහ සියළුම ජාතීන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමට එය දායක වන අන්දම පිළිබඳව මෙම සමාරම්භක අදහස් පලකිරීම තුළ කෙටියෙන් සාකච්ඡා කිරීමට ලැබුණු අවස්ථාව මා අගය කරනවා. ඉන්දියානු සාගරයේ භූ-උපායමාර්ගික වැදගත්කම පැහැදිලියි. ලෝකයේ බහාළුම් නෞකා ප්‍රමාණයෙන් භාගයක්; ලෝකයේ මහාපරිමාණ භාණ්ඩ ප්‍රවාහන ගමනාගමනයෙන් තුනෙන් එකක්; සහ ලෝකයේ නෞකාවලින් ප්‍රවාහනය කරන තෙල් තොග වලින් තුනෙන් දෙකක් ගෙන යනු ලබන ප්‍රධාන නැව් මාර්ග සහිත එය, ලෝකයේ වෙළඳ කටයුතු සඳහ අත්‍යාවශ්‍ය ජීවනාලියක් වනවා. කෙසේනමුත්, ලෝකයේ අනෙකුත් කලාපවලට බලපාන අභියෝගවලින් මෙම කලාපය පූර්ණ වශයෙන් මිදී නොමැතිවාක් සේම, මෙම කලාපයටම සුවිශේෂී අභියෝග ද තිබෙනවා. සමුද්‍ර තරණයේදී ආරක්ෂාව, මිනිස් සහ වනසත්ව වෙළඳාම, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය, පරිසර විනාශය සහ නීති විරෝධී මසුන් ඇල්ලීම මීට ඇතුළත් වනවා. අනෙකුත් කථිකයින් විසින් මතුකරන ලද ගැටළු අතරට ඇතුළත් වන මේ අභියෝග අතරින් ඇතැම් ඒවා සම්බන්ධයෙන් තම සාකච්ඡා තුළ ගැඹුරින් සලකාබැලීමට මණ්ඩල සාමාජිකයින්ට අවස්ථාවක් ලැබේවි යැයි මා බලාපොරොත්තු වනවා.

ලෝකයේ වඩාත්ම වේගයෙන් වර්ධනය වන ආර්ථික අතරින් ඇතැම් ඒවා ඇත්තේ ඉන්දු-ශාන්තිකර කලාපයේ වන අතර වර්ධනය වන තරුණ ජනගහනයක් සහිතව ආර්ථික වර්ධනය සඳහා අති විශාල ඉල්ලුමක් ද එහි තිබෙනවා. එය, සංකීර්ණ කලාපයක් වන අතර එහි ඇති අභියෝග ද ඒ හා සමානවම සංකීර්ණයි.

එනිසා, මේ ඇතැම් අභියෝග ආමන්ත්‍රණය සඳහා ගැලපෙන රාමුවක් ගැන සිතාබලන අවස්ථාවේදී අපගේ රටවලට පොදු, සහ සියළුදෙනාගේ සමෘද්ධිමත්බව සඳහා අත්‍යාවශ්‍ය වන ඒ මූලික මූලධර්ම සහ ජාත්‍යන්තර නියම වෙත අප නැඹුරු වියයුතු යැයි මා යෝජනා කරනවා. ඇත්තෙන්ම, සමුද්‍ර නීතිය සහ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතිය සමගින් අනුකූල වන පරිදි මුහුදේ හා ගුවනේ නිදහස සහතික කිරීම මෙහිදී වැදගත් කරුණක් වනවා. ස්වෛරී රාජ්‍යයන් බාහිරින් එන බලකිරීම්වලින් වෙන්කිරීම, වෙළඳපල පදනම් කරගත් ආර්ථික ප්‍රවර්ධනය, විවෘත ආයෝජන පරිසරයක් පවත්වාගැනීම, ජාත්‍යන්තර

නීතියට අනුකූල සාධාරණ හා අන්‍යොන්‍ය වෙළඳාම, සහ සාධාරණ තරඟකාරීත්වයේ මූලධර්ම අපට අවශ්‍ය වනවා. යහපාලනය, නීතියේ ආධිපත්‍ය සහ සිවිල් නිදහස හා මානව හිමිකම් කෙරෙහි ගරුකිරීම සඳහා අප විසින් සහය ලබාදිය යුතුයි. දශක ගණනාවක් මුළුල්ලේ මෙම කලාපයේ ගතික වර්ධනයටත් වේගයෙන් වැඩෙන සමෘද්ධියටත්  පදනම් සලසන පොදු වටිනාකම් හා ප්‍රතිපත්ති වන්නේ මේවායි.

මේ කලාපය සම්බන්ධයෙන් එක්සත් ජනපදයට ඉලක්කයක් තිබෙනවා, එනම්, ස්වෛරී හා ස්වාධීන රටවලට සහ විවිධ සංස්කෘතීන්ට එක්ව සශ්‍රීකත්වය කරා ගමන් කරන්නට හැකි නිදහස් හා විවෘත ඉඩක් සඳහා සහාය දීමයි. මේ රටවලට ඉහත කී දැක්ම හා ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා සාමකාමීව සහජීවනයෙන් සිටින්නට හැකිවීම එහිදී වැදගත් වනවා.

මෑතක දී සිදුකළ තම ශ්‍රී ලංකා සංචාරයේ දී පොම්පෙඕ ලේකම්තුමා සඳහන් කළ පරිදි, මෙය, ඇමරිකාවේ අභිමතය ශ්‍රී ලංකාව මත හෝ කලාපයේ වෙනත් හවුල්කරුවකු මත පැටවීමක් සහිත දැක්මක් නොවේ. ඇත්තෙන්ම, එය ඊටවඩා හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ දෙයක්. මිත්‍රයකු හා හවුල්කරුවකු වශයෙන් එක්සත් ජනපදය වෑයම් කරන්නේ ජාතික ස්වෛරීත්වය, ස්වාධීනත්වය හා තිරසාර සංවර්ධනය සඳහා අන්තර්කරණ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීමටයි. මෙහිදී අප අඬගසන්නේ සන්ධානයක් ගොඩනැගීමට වඩා මූලධර්ම වටා ඒකරාශීවීමටයි. කෙසේනමුත්, හවුල්කරුවන් හා කලාපීය ආයතන සමග සහයෝගීතාවය මෙම ප්‍රවේශයේ ප්‍රධාන තැනක් ගන්නවා. කිසිම රටකට හුදෙකලාව තම කලාපයේ අනාගතය හැඩගස්වන්නට බැහැ, එමෙන්ම, තමන්ගේ සාමූහික ලැදියාවන් ආරක්ෂා කරගැනීම සඳහා සහයෝගයෙන් ක්‍රියා කරන ස්වෛරී රටවල් සහිත ශක්තිමත් ජාලයක් නොමැතිව කිසිදු කලාපයක් සඳහා සකසන දැක්මක් සම්පූර්ණ වන්නේ නැහැ.

එනිසා, ඉන්දු-ශාන්තිකරයේ අපගේ සියළුම මුලපිරීම් නව හා පුළුල් සහයෝගීතා සඳහා විවෘත වේදිකාවන් වනවා.

සමුද්‍රීය ආරක්ෂාව හා සමුද්‍රීය බලප්‍රදේශ පිළිබඳ දැනුවත්භාවය ශක්තිමත් කිරීමට, මානුෂීය ආධාර හා ආපදා සහන සඳහා සහයවීමට, සාමසාධක කටයුතු සඳහා අරමුදල් ලබාදෙන්නට සහ දේශසීමා අබිබවා යන තර්ජන මැඩලීමට ඉන්දු-ශාන්තිකර කලාපය වෙත ආරක්ෂක ආධාර වශයෙන් එක්සත් ජනපදය ඩොලර් බිලියන භාගයකට වඩා ලබාදෙනවා. ඒවාගේම, විශ්වාසය සහිත හවුල්කාරීත්ව ගොඩනැංවීමටත්, තොරතුරු හුවමාරු කරගනිමින් ක්‍රියාත්මකවීමේ හැකියාව වර්ධනය කිරීමටත්, කලාපයේ ඉස්මතුවන අභියෝග සඳහා අප සියළුදෙනාටම වඩාත් හොඳින් ප්‍රතිචාර දැක්වීමට හැකියාව ලැබෙන පරිදි හවුල්කරුවන්ගේ හැකියාව සහ ධාරිතාවය වඩාත් පුළුල් කිරීමටත් පාක්ෂිකයින්, මිත්‍රයින් සහ හවුල්කරුවන් සමගින් සැලසුම් කරනු ලබන හමුදා අභ්‍යාස ද අප මෙම ඉන්දු-ශාන්තිකර කලාපයේ පවත්වනවා. උදාහරණයක් විදියට, අපගේ බෙංගාල බොක්ක මුලපිරීම හරහා ආරක්ෂාව සම්බන්ධයෙන් වන මෙකී ඇතැම් අභියෝග සහ ජාතික ආපදා ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය කරන තමන්ගේ හැකියාවන්  සහ තොරතුරු බෙදාහදාගැනීමේ ජාල වර්ධනය කරගැනීමට රටවලට උදවු කරනවා.

අපේ අභිමතාර්ථය වන්නේ සමුද්‍ර නීතිය පිළිබඳ සම්මුතිය හා අනුකූල වන පරිද්දෙන් සියළුම රටවලට පොදු සමුද්‍රීය තලය කරා සියළුම රටවලට ප්‍රවේශවිය හැකි හා ප්‍රතිලාභ ලැබිය හැකිවන සේ සමුද්‍රීය බලප්‍රදේශ ආරක්ෂා කිරීම, සමුද්‍ර තරණයට සහ අනෙකුත් නීත්‍යානුකූල පරිහරණයන් සඳහා මුහුද යොදාගැනීමට ඇති නිදහස පවත්වාගෙන යාමයි.

එමෙන්ම, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතියෙන් ස්ථාපිත කර ඇති ගුවනේ නිදහස සඳහා ගරු කරන බව සහතික කරගැනීම සඳහා අපි ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ අපගේ හවුල්කරුවන් සමගින් වැඩ කරනවා.

සමුද්‍රීය ආරක්ෂාව ආර්ථික ආරක්ෂාව සමගින් තදින් බැඳී ඇති බැවින් අපගේ දැක්මේ ආර්ථික සංරචකය ගැනත් වචන කිහිපයක් කථා කරන්නට මා කැමැතියි.

රජයක භූමිකාව වන්නේ පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂා කරමින් හා ජනතාව සවිබල ගන්වමින් නිදහස් ව්‍යාපාර කටයුතු සඳහා හැකියාව ඇති කිරීම බව එක්සත් ජනපදය විශ්වාස කරනවා. අප මෙය කරන්නේ, වෙළඳපල ප්‍රවේශය හා තරඟකාරීත්වය වැඩිදියුණු කිරීම හරහා, ව්‍යාපාරවල සිට ව්‍යාපාර දක්වා සම්බන්ධතා ඇතිකරගැනීමට පහසුකම් සැලසීම හරහා, සහ නිදහස්, සාධාරණ හා අන්‍යොන්‍ය වෙළඳාම දිරිගැන්වීම හරහා යි.

කොළඹගේ විදේශ ලේකම්තුමා සඳහන් කළ කරුණු අනුව යමින් මේ කලාපය සම්බන්ධයෙන් ඊට සමාන නිරීක්ෂණයක් ඉදිරිපත් කරන්නට මා කැමතියි. ඉන්දු-ශාන්තිකර කලාපයේ ඇති සංවර්ධනය වෙමින් පවතින රටවලට සෑම වර්ෂයකදීම යටිතල පහසුකම් ආයෝජන වශයෙන් අවම වශයෙන් ඩොලර් ට්‍රිලියන 1.7ක් හෝ ඊටත් වඩා ඩොලර් ට්‍රිලියන ගණනක් අවශ්‍ය වනවා. මේ සම්බන්ධයෙන් මා සඳහන් කරන දෙවන කාරණාව නම්, කිසිම රජයකට ඒ සා විශාල මුදල් ප්‍රමාණයක් නැහැ. තුන්වන කාරණාව නම්, ලෝකයේ මූල්‍ය මධ්‍යස්ථානවල ගොඩගැසුනු මිලියන 70ක් තිබෙනවා. මේ ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් ඉන්දු-ශාන්තිකර කලාපයට යොමු කරවාගැනීමටත් ආයෝජනයෙන් සැබෑ ප්‍රතිලාභ ලබාදෙන්නා වූ තිරසාර ව්‍යාපෘති සඳහා එම අරමුදල් යොදවනු ලබන බව සහතික කරගැනීමටත් එක්සත් ජනපදයට අරමුණක් තිබෙනවා.

කොළඹ නගරයට සංචාරය කළ අවස්ථාවේ පොම්පෙඕ ලේකම්තුමා, මේ වසංගතයෙන් පසුව ආර්ථිකය නැවතත් යථා තත්වයට පත්කරගැනීමේදී සෑම රටකටම පෞද්ගලික කර්මාන්තවල ශක්තිය අවශ්‍ය කරනු ඇති බව පැවසුවා. වසංගතයෙන් පසුව නැවතත් යථා තත්වයට පැමිණීමක් සාක්ෂාත් කරගැනීම සඳහා අපගේ හවුල්කරුවන් සමගින් එක්ව වැඩ කිරීමට එක්සත් ජනපදය උනන්දුවෙන් සිටිනවා. දැනටමත්, මේ කලාපය තුළ එක්සත් ජනපද සෘජු විදේශ ආයෝජන සෑහෙන ප්‍රමාණයක් තිබෙනවා. ඩොලර් ට්‍රිලියනයකට ආසන්න අගයක් ගනිමින් එය, ගතවූ දශකය තුළ දෙගුණයකට වඩා වැඩි වී තිබෙනවා. ඇමරිකානු ආයෝජන තුළින් ණය නොව, රැකියා නිර්මාණය වනවා. මේ කලාපය තුළ ඇමරිකානු ආයෝජන හරහා රැකියා මිලියන 5කට අධික ප්‍රමාණයකට සහය දක්වනවා.

ඇමරිකානු විදේශ ආධාර සහ එක්සත් ජනපදයෙන් ආධාර ලබන ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන මෙම කලාපයේ වර්ධනය හා සමෘද්ධිමත්භාවය සඳහා පාදම් වූ දායකත්වයන් දශක ගණනාවක සිට ලබාදී තිබෙනවා. මෑත වර්ෂවලදී ඉන්දු-ශාන්තිකරය සඳහා වන අපගේ දැක්ම අනුව යමින් එක්සත් ජනපද රජය වාර්ෂිකව ආධාර වශයෙන් ඩොලර් බිලියන 2ක් පමණ බැගින් ලබාදී තිබෙනවා. ඊට, යටිතලපහසුකම්, බලශක්තිය හා ඩිජිටල් ආර්ථිකය යන ක්ෂේත්‍රවල පෞද්ගලික ආයෝජන දිරිගන්වන්නා වූ නව මුලපිරීම් ඇතුළත් වී තිබෙනවා.

එමෙන්ම, ජාතික ස්වෛරීත්වය හා දේශීය ස්වාධිපත්‍ය සමගින් ගැටෙන, ආර්ථිකයන් බෙලහීන කරන ණය ඔවුන් මත පටවන, සහ දූෂණ ක්‍රියා දිරිගන්වන රජය-මූලික කොටගත් මූල්‍යකරණය වෙනුවට විකල්පයක් වශයෙන් පෞද්ගලික අංශය පුළුල් කිරීම සඳහා ද අප කැපවී සිටිනවා. ඇමරිකානු සමාගම් විනිවිදභාවයෙන් යුක්තයි, ඒවා විශ්වසනීයයි, එමෙන්ම ඒවා විදේශවල දූෂණ ක්‍රියා පනත ඇතුළු එක්සත් ජනපදයේ නීතිවලට වගවිය යුතුයි.

තිරසාර ආර්ථික සංවර්ධනය යනු යහපාලනය තුළ තදින්ම මුල් ඇදගත් සංකල්පයක් වන අතර, එක්සත් ජනපදය පුරවැසි-ප්‍රතිචාරී පාලනයට සහ ව්‍යවසායකත්වය හා ප්‍රාග්ධනය ඵලදායී ලෙස යෙදවීම පෝෂණය කරන්නා වූ සැහැල්ලු එහෙත් තද නීතිරීති සඳහා සහය ලබාදෙනවා. ඒ වාගේම අප විනිවිදභාවය, සාධාරණත්වය සහ ගිවිසුම්වල අද්විතීයබව ප්‍රවර්ධනය කරන ආයතනවලට සහය ලබාදෙනවා.

විශ්ව මානව හිමිකම් ප්‍රකාශය සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය වැනි ජාත්‍යන්තර සාධනපත්‍රවලින් ආරක්ෂා කර දෙන මානව හිමිකම්, ආගමික නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් වෙනුවෙන් හඬ නැගීමට අප දරන උත්සාහයන් තුළ අප නොසැලී කටයුතු කරනවා. සියළුම ජාතීන්ට මේ පොරොන්දු ආරක්ෂා කරන්නට අප සමගින් එක්වන මෙන්  අප උනන්දු කරනවා.

තිරසාරවීමට නම්, ආර්ථිකයන් විවෘත, විනිවිදභාවයෙන් යුක්ත සහ නීති-පදනම් කරගත් ආර්ථික විය යුතු යි. යටිතලපහසුකම් ඉදිකිරීම පමණක් නොව ඒවා නඩත්තුව ද සිදුවිය යුතු යි. රාජ්‍ය කොන්ත්‍රාත්තු ඉතාමත් ඉහළ මට්ටමක විනිවිදභාවයකින් යුක්ත වියයුතු අතර කල් පවත්නා, ඉහළම තත්ත්වයේ ව්‍යාපෘති ඒවා මගින් සහතික කළ යුතුයි- මේ අරමුණ, ජී20 මගින් ස්ථාපිත කරන ලද අරමුණක්. මීට වඩා අඩු මට්ටමක් තුළ දූෂණ ක්‍රියා සඳහා සහ වියදම් කප්පාදු කිරීමට යාම සමගින් ඉදිකිරීම්වල ගුණාත්මකබව දුර්වලවීමට අවදානමක් නිර්මාණය වනවා.

පොම්පෙඕ ලේකම්තුමා විසින් ද සඳහන් කළ පරිදි, වෙනත් කටයුතුවලට යොමු වී ඇති ඒ ඩොලර් ට්‍රිලියන ගණනක පෞද්ගලික අයෝජන ඔවුන්ගේ ආර්ථික වෙත ගලා විත්, ජනතාවට රැකියා හා සමෘද්ධිමත්බව ලබාදෙන ඵලදායී ව්‍යාපාර කරා යොමුවනු ඇත්තේ ඒවා සාදරයෙන් පිළිගන්නා රටවල් බවට මෙම රටවල් පත්වුවහොත් පමණයි. එසේ වන්නට නම්, ඉන්දු-ශාන්තිකරයේ නායකයින් විනිවිදභාවය, දූෂණ විරෝධීභාවය සහ වගකීමෙන් යුත් මුල්‍යකරණය සඳහා ප්‍රමුඛස්ථානය දිය යුතුයි.

අවසාන වශයෙන්, අද දින සමුළුව හරහා සියළුම රටවලට සහ ඒවායේ ජනතාවට සමෘද්ධිමත් වියහැකි නිදහස් හා විවෘත ඉන්දු-ශාන්තිකර කලාපයක් සඳහා වන දැක්මක් ඇතිකරගනු පිණිස මේ ප්‍රතිමානයන් සහ පොදු මූලධර්ම ගවේෂණය හා ව්‍යාප්තිය සිදුවනු ඇතැයි මා බලාපොරොත්තු වනවා. ස්වෛරීත්වය හා ජාතික ස්වාධීනත්වය සඳහා ගරු කිරීම; නිදහස්, සාධාරණ හා අන්‍යොන්‍ය වූ වෙළදාම පදනම් කරගත් විවෘත ආයෝජන සහ විනිවිදභාවයෙන් යුත් එකඟතා හා සම්බන්ධවීම්; සහ සමුද්‍ර තරණයට හා ගුවන් තරණයට ඇති නිදහස ඇතුළු ජාත්‍යන්තර නීතියට අනුකූලතාවය දැක්වීම ඇතුළු ඉන්දු-ශාන්තිකර කලාපයට මෙතෙක් ඉතා යහපත් ප්‍රතිඵල ගෙන දී ඇති ඒ වටිනාකම් වෙනුවෙන් ඉදිරිපත්වීමට අප විසින් කටයුතු කළයුතු යි. අපට තිබෙන පොදු වටිනාකම් මේවා යි. අප පොදුවේ කැප වී සිටින ජාත්‍යන්තර සම්මුතීන් තුළ ඇතුළත් වී ඇත්තේ ද මේ වටිනාකම් වන අතර, අපගේ රටවල් අතරේ විශ්වාසය ගොඩනැංවිය හැක්කේ ද මේ ප්‍රතිමාන හා මූලධර්ම වටා යි.

අද උදෑසන මේ වෙනුවෙන් ලබාදුන් කාලය වෙනුවෙන් ස්තුතියි, මේ කටයුත්ත මුළුල්ලේ පවත්වන මණ්ඩල සාකච්ඡා හරහා තවදුරටත් දැනුවත්වීමට මා උද්යෝගයෙන් සිටිනවා.

ස්තුතියි.